

ජනප්‍රිය පාසල් රැල්ල මෙහෙත් තියෙනවාද..?

නලිනි දේවේන්ද්‍ර

ගණන් ඉලක්කම් අතරින් ඩෘස විභාගයට

ඒ.සී.ඊ. විභාගය කියන්නේ මොහොටගේ විභාගයක් ද කියලාත් ගණිතය විෂයය මොනවගේ විෂයක්ද කියලාත් පසුගිය වර ලිපියෙන් නලිනි දේවේන්ද්‍ර ගණිත අාචාර්යවරිය සන්නස පාඨක ඔබට පහැදිළි කළා. ඒ වගේම වික්ටෝරියානු අධ්‍යාපන ක්‍රමයත්, ඒ.සී.ඊ. විභාගයත්, ගණිත විෂයත් මේ තාක් කල් අා ගමන් මග ගැනත් අැය විස්තර කළා.

සන්නස යියවර පොරොන්දු වුණා වගේම මේ වාරයේ කතා කරන්න අදහස් කරන්නේ දෙමව්පියන්ගේ ගිතට දානුන, ඔවුන් අහන එක ප්‍රශ්නයක් ගැනයි.

ලංකාවේ තියෙන ජනප්‍රිය පාසල් රැල්ල මෙහෙත් තියෙනවාද කියන කාරණය සන්නසට මුලින්ම ගිතට ආවේ දෙමව්පියන් කීපදෙනෙක්ම ඒ ගැන කණස්සල්ලෙන් කතා කළ නිසා. ''අපි නම් හිතාගෙන අාවේ මෙහෙ කියන හැම ඉස්කෝලයකම එක වගේ හොඳයි කියලා.'' ''එහේ හොඳ ඉස්කෝලෙකට ළමයින්ව දාගන්න බැරි වුණා එකත් මෙහෙ එන්න එක හේතුවක් වුණා. ඒත් මෙහෙ අාවම ඊටත් හපන්.''

ඒ කීපදෙනෙකුගේ මැසිවිලි.

''නලිනි මේ ගැන මොනවද හිතන්නේ''? සන්නස අැහුවා.

මෙහෙත් ඉස්කෝල අතර වෙනස්කම් තියෙනවා. හොඳ ඉස්කෝලයට දරුවන් අැතුළත් කරන එක නම් ඉතාම වැදගත්. හොඳ ඉස්කෝලයක් කියන්නේ පිළිලෙළකට වැඩකරන, නරකෙ හෝ විනය පැවැත්තියක් තිබි වදිනට ක්‍රියාත්මක වෙන, විෂයමාලා සහ අනිකුත් ලිය කියවිලි පිළිවෙලට සකස් කර තිබෙන පාසැලයි.

මම කලින් දවසෙත් කිව්වා වගේ, 7 වන ශ්‍රේණියේ, 10 වන ශ්‍රේණියේ අතර දරුවන්ට ඉගැන්වීම මේ රටේ ටිකක් අමාරු කාර්යයක්. ඉගෙන ගන්නා දේ හුගක් අභියෝගාත්මක වුණොත් ඒ දෙස ඉගෙන ගන්න එක අත හරවා දැමේ දෙයක් නෝ‍ා ගන්න සාමාන්‍යයෙන් මේ ළමයින් පෙළගෙනවා. ඉතින්, පාසැල්වල විභාග සහ අනිත් අැගැයීම්, පැවරුම් සකස් කෙරෙන්නේ හැම ළමයෙකුටම 75%, 80% ලකුණක්වත් ලබා ගන්නට හැකි වෙන අාකාරයටයි. මොකද අධ්‍යාපනය කියන එක හැම දරුවෙකුටම ධනාත්මක අත්දැකීමක් (Positive Experrence) විය යුතුයි කියන ප්‍රතිපත්තිය මත තමයි මේ අධ්‍යාපන පද්ධතිය

හැම ශිෂ්‍යයෙකුටම ධනාත්මක අත්දැකීමක් ලබාදීම මේ රටේ ගුරුවරුන්ගේ මහාණ්ඩාගාරික අභියෝගයක්.

ගොඩනැගිලා තියෙන්නේ.

හැම ශිෂ්‍යයෙකුම ධනාත්මක අත්දැකීමක් ලබාදීම මේ රටේ ගුරුවරුන්ගේ මූලාණදෙන විශාල අභියෝගයක්. ඒකට හේතුව, සාමාන්‍යයෙන් 8 වන, 9 වන හා 10 වන ශ්‍රේණිවල ඳී දරුවන් විනයානුකූලව හසුරුවා ගෙන පාඩම් වැඩ කටයුතු දිනට කරගෙන යාම සමහර විට තරමක් අමාරු කාර්යයක් නිසා. ඉවසීමෙන්, බොහෝ වෙලාසෙ මහන්සි වෙලා අධ්‍යාපන කටයුතු කරනවාවවට බොහෝ රසවත් සතුට ගෙන දෙන දේවල් පත්ති කාමරයෙන් පිටත තිබෙන නිසා, මේ දරුවන්ගේ සම්පූර්ණ අවධානය ලබාගෙන ඉගැන්වීම අත්තටම අමාරුයි.

උවමනාවකින් අාගාමියි අලෙන ගන්නේ නැති දඟකරන දරුවන් තුගක් සිටින පන්තියක දරුවන්ගේ දැනුම මට්ටම සාමාන්‍යයෙන් අඩුයි. පන්තියක වැඩ කටයුතු අඩාල වුවහොත් දඟ ළමයින් තුන් හතරදෙනෙක් හිටියත් අැති. ඉතින් මේ වගේ දරුවන් හිතිවෝ විනයට විරෝධව පුළුවන්කම අැති පළපුරුදු ගුරුවරුන් හා සවිඥේ විනය පද්ධතියක් පාසැල්වල නැත්නම්, ඉගැන්වීම හරියාකාරව කෙරෙන්නේ නෑ.

10 වන ශ්‍රේණිය අවසානයේදී ලංකාවේ වගේ පොදු විභාගයක් මේ රටේ නැති නිසා විවිධ පාසැල්වල ඉගෙන ගන්නා දරුවන්ගේ දැනුම සාඝාදනය කිරීමට අවස්ථාවක් 10 වන ශ්‍රේණියේදී ලැබෙන්නේ නෑ. ඉතින් ගණිතය විෂයය ගැන කථා කළොත්, උත්තරුවෙන් උදෘාගයෙන් සහ වගකීමෙන් යුතුව ඉගෙනීමේ කටයුතුවල යෙදෙන දරුවන් වැඩි ප්‍රමාණයක් අැති පාසැලක දරුවන් 10වන ශ්‍රේණියේදී මූහුණදෙන විභාග, පැවරුම් සහ ළබා ගන්නා දැනුම මේටමේ. දඟකරන දරුවන් වැඩියෙන් සිටින පාසැලක දරුවෙක් මූහුණ දෙන ඇගයීම් සහ දැනුම මේටමේ අතර සෙනෙහ වෙනසක් තිබෙන්නට පුළුවන්, මේ බව මා පොද්ගලිකවත් අත්දැකා තිබෙනවා.

දරුවා පිළිබඳව පාසැලෙන් ළබෙන වාර්තාවල (End o the Semester and end of the year reports) බොහෝවිට දරුවාගේ හොඳ ගුණවිශේෂනාවන් දැක ගන්නට ළබෙනවා. දරුවාගේ අඳුප්පු දුර්වලතා යන්නමින් පෙන්නා දෙන්නේ හොඳ දේවල් බොහෝමයක් කියා ඉවර වෙලයි. කිසිම වෙලාවක දරුවෙක් දුර්වලයි කියා හෙළා දකින්නේවත්, එක් දරුවෙක් නවත් දරුවෙක් සමඟ සංසන්දනය කරන්නේවත් නෑ. අා මා මූලින් කිව්ව ''ධනාත්මක අත්දැකීම'' (Positive experience) හැම දරුවෙකුටම ළබාදීම මේ අධ්‍යාපන පද්ධතියේ ප්‍රතිපත්තිය නිසායි එහෙම කෙරෙන්නේ. ඉතින් දෙමව්පියන් මේ වාර්තා දිහා ඉතාම සැළකිල්ලෙන් බළලා, ගුරුවරුන් මූණ ගැහිලා සාකච්ඡා කරන එක ඉතාම වැදගත්. මොකද වාර්තාව (report) දිහා බළලා බොහෝවිට වැරදි වැරැහිමක් අැති කර ගන්න ඉඩකඩ තියෙන නිසා. දරුවන් ගැන හුගක් අවධානයෙන් නොහිටියොත් 10 වන ශ්‍රේණිය අවසාන වනතුරුම දරුවාව පුළුවන් මොනවද බැරි මොනවද කියලා හරි අවබෝධයක් දෙමව්පියන්ට ළබෙන්නේ නෑ.

ලංකාවේ නම් විෂයයන් තෝරා ගැනීමේදී සහජ හැකියාව බොහොම බලපානවාගෙන්, මෙහෙ එහෙම වෙයක් නෑ. හැමෝටම අවස්ථාව දෙනවා තමන් කැමති දේ තෝරා ගන්නට. එහෙත් තමාට පුළුවන් මොනවද බැරි මොනවද කියලා හරි අවබෝධයක් දරුවෙක්ට නැත්නම්, තමන්ගේ දරුවාගේ දක්ෂතා සහ දුර්වලතා ගැන අවබෝධයක් දෙමව්පියන්ටත් නැත්නම් ඒ.සී.ඊ. වලදී වරදිදි විෂයයන් තෝරාගෙන අමාරුවේ වැටෙන්නට ඉඩ තියෙනවා.

7 වන ශ්‍රේණිය සිට 10 ශ්‍රේණිය දක්වා අැති පාඩමාලා එතරම් අභියෝගාත්මක නැති නිසා 10 වන ශ්‍රේණියත් 11 වන ශ්‍රේණියත් අතර ඉතා විශාල පරතරයක් තියෙනවා. ඒ.සී.ඊ. ගණිතය පමණක් නෙවෙයි අනිත් හැම විෂයයක්ම වාගේ අභියෝගාත්මකයි. විනයානුකූලව ඉගෙනීමේ කටයුතු කරන දරුවන් සහිත නිසි පිළිවෙලට වැඩ කරන පාසැලක, 7-10 දක්වා පාසැලක සකස් කෙරෙන්නේ දරුවන්ව 11 වන ශ්‍රේණියේදී මේ අභියෝගයට මූහුණදීමට පහසු වෙන ආකාරයටයි. මෙවැනි පාසැලක 10 වන ශ්‍රේණියේදී පවත්වන විභාග සහ පැවරුම් ඉහළ මට්ටමක පවතින නිසා දරුවාව 10 වන ශ්‍රේණියේ දී ළබන ලකුණු මට්ටම අනුව එක් එක් ඒ.සී.ඊ. විෂයය සඳහා දරුවාගේ අැති යොගතාවය තීරණය කිරීම එතරම් අපහසු නෑ. විශේෂයෙන්ම ගණිතය විෂයය ගැන බැලුවොත්, ගණිතයට විශේෂ හැකියාවක් නැති දරුවන්ට 11 වන ශ්‍රේණියේදී ගණිත කුම (Maths Methods) තෝරා නොගෙන වැඩිදුර ගණිතය (Further maths) තෝරා ගන්නට කියා ගුරුවරුන් හිරිදේශ කරනවා. ඒ වගේම ගණිතයට හැකියාවක් තිබෙන දරුවන්ව වැඩිදුර ගණිතය (Maths Methods) සහ ගණිතයට ඉතා දක්ෂ දරුවන්ට ''විශේෂෙදැ ගණිතය'' (Specialist Maths) තෝරා ගන්නට කියා හිරිදේශ කරනවා.

Specialist Maths අවශ්‍ය වන්නේ ඉංජිනේරු විද්‍යාව හැදෑරීමට බලාපොරොත්තු වන දරුවන්ටයි. මේ විෂයය තනිවම හදාරනනට බෑ. Maths Methods කිරීම අත්‍යාවශ්‍යයි. Maths Methods විෂයයේ ඒකක 1 සහ 2 11 වන ශ්‍රේණියේදීත් ඒකක 3 සහ 4 12 වන ශ්‍රේණියේදීත් කෙරෙනවා. Specialist Maths වල තියෙන්නේ ඒකක 3 සහ 4 පමණයි. මේ දෙක කෙරෙන්නේ 12 වන ශ්‍රේණියේදී, ඒත් බොහෝ පාසැල්වල 11 වන ශ්‍රේණියේදී General Maths Advanced නමින් හැදින්වෙන ගණිත ඒකක දෙකක් කෙරෙනවා''pecialist Maths වලට උඳවිවක් වෙන හැටියට. ඒක අභිවාර්ය දෙයක් නෙවෙයි.

නිසි පිළිවෙලට වැඩකටයුතු කෙරෙන පාසැලක 10 වන ශ්‍රේණියේ දී දරුවාන් දැනුම මට්ටම ගැන විශේෂ අවධානයක් යොමු වී, විනාය සහ අනිත් අැගැයීම්වලට ළබන ලකුණු මට්ටම මත Maths Methods, Specialist හෝ Further Maths තෝරා ගැනීම පිළිබඳ නිවැරදි මගපෙන්වීමක් ගුරුවරුන්ගෙන් ළබෙනවා. Maths Methods හෝ Specialist Maths තෝරාන්න කලම් දැනුම මට්ටම ප්‍රමාණවත් නැත්නම් ඒ බව දරුවාවත් දෙමව්පියන්වත් හිත නොරෙදෙන ආකාරයට එහෙත් අත්ත අැතිසැටියි තෝරලා දෙනවා.

මම මුලින් කිව්වා වගේ දරුවෙකුට ඒ.සී.ඊ. සඳහා ගණි විෂයක් තෝරා ගැනීමට එපා කියා බලකරන්නට ගුරුවරුන්ට හිතියෙන් අවසර නැහැ. එහෙත් හිරිදේශ කරන්නට පුළුවන්.

Victorian Tirtiary Entrance Requirements (Victer) කියන පොත 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ළබන දරුවන්ට ළබා දීලා, ඒ පොතේ දක්වා තිබෙන පිළිවෙලට තමන් විෂිව විද්‍යාලයේදී ඉගෙන ගැනීමට බලාපොරොත්තු වනව පාඨමාළා වලට අවශ්‍ය මූලික සුදුසුකම් වලට ගැලපෙන විෂයයන් ඒ.සී.ඊ. සඳහා තෝරා ගැනීමට හිරිවැදි වදිනට මග පෙන්වන එක ඉතාම වැදගත්. ඉතින් මේ සියළුම නිසි පිළිවෙලට සිදු කෙරෙන පාසැලක්, විනයානුකූලව උදෘෝගයෙන් සහ වගකීමින් ඉගෙනීම කරන දරුවන් වැඩි ප්‍රමාණයක් සහිත, ඉගෙනීමට සුදුසු වට පිටාවක් අැති පාසැලක් වෙනෙස මහන්සි වී සොයා ගැනීමේ වටිනාකමක් නෑ කියන්න පුළුවනිද?

නලිනි ප්‍රශ්නාර්ථයෙන් නලල රැඳී ගැන්නුවා.

පාසැල් අධ්‍යාපනය සාර්ථකව නිමා කරන්නට නම් මේ රටේ දරුවෙකුට තමන්ගේ වැඩ කටයුතු පිළිවෙලට කර ගැනීමට අවශ්‍ය ස්වයං විනය තිබිය (Self discipline) නිබිය යුතුමයි. අති දක්ෂ දරුවෙකුට වුණත් මේ ස්වයං විනය නැත්නම් වැඩිදුර යන්න අමාරුයි.....

අැය තවත් දවසක කතිකාවතකට විරාමය තැබුවා.

සාකච්ඡා කළේ සිසිර දිසානායක

4 වන පිටෙන්

කිහිපයක් පොළිස් භාරයට ගැනීමෙන් අනතුරුවය.

පසුගිය කාල පරිච්ඡේදය තුළ මාධ්‍යයට ලොකුම බාධා කිරීම සිදුවුණේ ආණ්ඩුවේ ආරක්ෂක අංශ විසිනි. එයින් පහැදිළි වෙන්නේ ආණ්ඩුව සිය ආරක්ෂක අංශ හරහා නොකිළි මධ්‍ය මේදුනයක තියැලී සිටින බවයි. ''සන්ඩේ ඊඩියර්'' පුවත්පතේ ජ්‍යාෂ්ඨ ලිපිවී අශෝක ප්‍රනාන්දු ගෙනාදෙ පසුගියදා මෙරටම පොළිසිය ගිහින් අත්තනෝමතික ලෙස අත්භවංගුවට ගෙන පහරදීමෙන් ලක් කළේ පත්තිපිටියේ විහාරස්ථානයක තිබූ විරෝධතා ව්‍යාපාරයේ වාර්තා කිරීමට ගොස් සිටියදීය. ඔහුට පහර දී ගැබොලේ සේයාපට හා ඔහුවද අත්භවංගුවට ගෙන බොර චෝදනාවක් එල්ල කර අධිකරණයට ඉදිරිපත් කර තිබුණේ ඉතාමත් නින්දිත ආකාරයටය.

දිගින් දිගටම බොර චෝදනා එල්ල කරමින් මාධ්‍යවේදීන් සිර කිරීමට ආණ්ඩුව උත්සාහ ගනිමින් සිටී. එවැනි තවත් දෙයක් පසුගිය නොවැම්බර් මාසයේ සිදුවුණේ ''මේවිම'' පුවත්පතය. දඹුලු මාධ්‍යවේදියෙකු වන 'පරමේශ්වරව' කොලුඹ ත්‍රස්තවාදී විමර්ශන කාර්යාංශය මගින් අත්භවංගුවට ගෙන තවමත් එහි රඳවා සිටින්නේ කොට මත්ත්‍රකාරියක යන චෝදනාව යටතේය. නමුත් අැයට විරුද්ධව මේ වනතුරුත් කිසිඳු චෝදනාවක් මේපු කර නෑත. ''ත්‍රස්තවාදය වැඳගැනීමේ පනත'' යටතේ මාධ්‍ය මේදුනය නොතෙරුන බවට රජය ප්‍රකාශ කළත් අද සිවුවන්නේ රට ප්‍රතිවිරුද්ධ දෙයකි.

රට හොඳම උදාහරණය නම් ''ත්‍රස්තවාදය වැඳගැනීමේ පනත'' දාමිමා කරගෙන ශ්‍රේෂ්ඨාධිපති අායතනයේ මාධ්‍යවේදීන් තිදෙනෙකු රහස් පොලිසි භාරයට ගෙන ප්‍රශ්න කර තිබිණි. ඒ 'සන්ඩේ ඔබ්සර්වර්' පුවත්පතේ සහ කර්තෘ ළයනල් ගෝදමාල, ප්‍රවෘත්ති කර්තෘ රංග පයසුරිය හා ''සිළුමිණ''පුවත්පතේ ප්‍රසාන්ත පොන්සේකා යන තිදෙනාය. ඔවුන් පුවත්පතේ පළ කළ කිසිඳම ලිපියක් ඉලක්ක කරගෙන රහස් පොලිසිය ත්‍රස්තවාදය වැඳගැනීමේ පනත යටතේ ලිපියට හොරතුරු ළබාදුන් පුද්ගලයන් පිළිබඳව ප්‍රශ්න කර තිබිණි.

එය සම්පූර්ණයෙන්ම මාධ්‍ය නිදහසට එල්ල කළ බරපතළ තර්ජනයකි. මොනම හේතුවක් මතවත් පුවත්පතට හොරතුරු ළබාදුන් අය පිළිබඳ ප්‍රශ්න කිරීමේ අයිතියක් රහස් පොලිසියට නැත. එවැනි තත්ත්වයක් තුළ ඔවුන් මේ කර අත්තේ සම්පූර්ණ නීති විරෝධී දෙයකි.

පසුගිය සතියේ බළපිටිය රෝහලේ පැවැති උත්සවයකට සහභාගී වෙමින් හිමල් සිරිපාල ද සිල්වා අැමැතිවරයා ප්‍රකාශ කර තිබුණේ 'රෝ හඳ් ගල අඳුපාලු ළිඟක මාධ්‍යවේදීන්ද කතා දෙයක් ගසා වළපා දමන ළෙඩයි. රජයේ වගකිව යුතු අැමැතිවරයෙකු මෙළෙස ප්‍රකාශ කිරීම බරපතළ දෙයකි. එමගින් ඔහු මාධ්‍ය මේදුනයට පිටස්තර බලවේගවලට පවා උළුවහුමි දී අැති බවක් පෙනේ.

ජනාධිපති මෙතේද රාජපක්ෂ මහතා මාධ්‍ය නිදහස සුරක්ෂිත බවට, රජය අපට කැපවී සිටින බවට ප්‍රකාශ කරන විට ඔහුගේ ආණ්ඩුවේම ප්‍රබල අැමැතිවරයෙකු මෙළෙස ප්‍රකාශයක් කිරීම බරපතළ බේරුවාකයකි. ආණ්ඩුව එක් පැත්තකින් මාධ්‍ය නිදහස සුරක්ෂිත බවට ප්‍රකාශ කළත් අනෙක් පැත්තෙන් මාධ්‍ය මේදුනය කිරීමට පෙරමුණ ගෙන අැති බවක් මින් පෙනේ. විශේෂයෙන්ම ආණ්ඩුව ඒ සඳහා අළුත් පනතක්ද තබාගෙන සිටී. ඒ ''ත්‍රස්තවාදී වැඳගැනීමේ පනතයි'' එයට මූල වී ආණ්ඩුව මෙළෙස හැසිරීමට පටන් ගැනීමේ පෙන්නුම් කරන්නේ ඉදිරියේදී මාධ්‍යයට තවදුරටත් හොඳ කාලයක් උදා නොවන බවය. 2006 සිසර තුළ මෙරටම බරපතළ මාධ්‍ය මේදුනයක් සිදුවුවා නම්, 2007 වර්ෂය මිට වඩා බරපතළ විය හැකි බවට අැති සාධක එමටය. එබවින් ඉදිරිය මාධ්‍යයට තව තවත් මරු කැදවන වර්ෂයක් වීමට බැරි නැත.

■